# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 26 දරන ශ්‍රී ලංකා ඉතිහාස සංගමය
## (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 27 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 මැයි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50

## 1998 අංක 26 දරන ශ්‍රී ලංකා ඉතිහාස සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 30/96.

**ශ්‍රී ලංකා ඉතිහාස සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ශ්‍රී ලංකා ඉතිහාස සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සංගමයේ සියලු පරමාර්ථ සහ ඒ හා සම්බන්ධ කාරණා ඵලදායි ලෙස ඉෂ්ට කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා 1990 වර්ෂයේ දී පිහිටුවන ලද හෙයින් ද ;

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා එකී සංගමය විසින් සාර්ථකව ඉෂ්ට කර සහ ක්‍රියාත්මක කර ඇති හෙයින් ද ;

එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1998 අංක 26 දරන ශ්‍රී ලංකා ඉතිහාස සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ඉතිහාස සංගමය සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ඉතිහාස සංගමයේ දැනට සිටින තාක් සාමාජිකයන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසු "ශ්‍රී ලංකා ඉතිහාස සංගමය" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාවේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉතිහාස අධ්‍යයන පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම සහ වැඩි දියුණු කිරීම ;

2—D 042690—5,900 (97/01)

(ආ) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ ශිෂ්ටාචාරය පිළිබඳ සංසන්දනාත්මක සහ අගැයුම් සහිත අධ්‍යයන කිරීම ;

(ඇ) පුස්තකාලයක් පිහිටුවීම සහ වෙනත් සේවා සැපයීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය පොත්, සඟරා, වරිකාපදාන, විශේෂ නිබන්ධන සහ වාර සංග්‍රහ මුද්‍රණය කිරීම, පළ කිරීම සහ විකිණීම :

(ඈ) ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය, විශේෂයෙන් ආසියාතු සංස්කෘති සහ ශිෂ්ටාචාර අධ්‍යයනය සඳහා කැපවුණු ශ්‍රී ලංකාවේ සහ පිටරට සංවිධාන සමඟ මිත්‍ර සම්බන්ධතා ඇති කර ගැනීම :

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා සභා, වැඩ මුළු, අධ්‍යාපනික චාරිකා සහ වෙනත් ක්‍රියාකාරකම් පිළියෙළ කිරීම, සංවිධානය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම:

(ඊ) සංස්ථාවේ පරමාර්ථවලට අදාළ මාතෘකා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දී හෝ විදේශීය රටවල දී, පැවැත්වෙන සම්මන්ත්‍රණවලට නියෝජිතයන් යැවීම :

(උ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට පියවර ගැනීම :

(ඌ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම අරභයා වූ කාර්යවල යොදවා ඇති සංස්ථාවේ සාමාජිකයන්ට සහ සේවකයන්ට ශිෂ්‍යත්ව හෝ ප්‍රදාන මඟින් උපකාර කිරීම :

(එ) සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා අරමුදල් එකතු කිරීම : සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

4. (1) සංස්ථාවේ කටයුතු තත් කාලයේ බලපවත්වන සංස්ථාවේ රීතිවලට අනුකූලව සංස්ථාවේ සභාපති, උප සභාපතිවරුන් සහ සංගමය විසින් තෝරා පත් කර ගනු ලබන වෙනත් නිලධාරීන්ගෙන් ද සමන්විත පාලක සභාවක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ පාලක සභාව සංස්ථාවේ ප්‍රථම පාලක සභාව විය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

5. සංස්ථාවේ පාලක සභාව විසින් සාමාජික ලේඛනයක් පවත්වා ගෙන යාමට සැලැස්විය යුතු අතර මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී සමිතියේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකුගේ සහ ආයතනයක ම නම සහ ඊට පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් නිසි ලෙස බඳවා ගනු ලබන සෑම තැනැත්තකුගේ හෝ ආයතනයක නම එම ලේඛනයට ඇතුළත් කළ යුතුය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ මහ සභා රැස්වීමක දී, එහි පැමිණ සිටි හා ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙපංගුවකට නොඅඩු ඡන්දයෙන් සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් සංස්ථාවේ නිලධාරීන් සහ පාලක සභාවේ තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන්, සංස්ථාවේ පාලක සභාව සංස්ථාවේ නිලධරයන්, භාරකරුවන්, අනුයෝජිතයන් සහ සේවකයන් විසින් කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන්, සංස්ථාවේ පාලක මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධානවලට හා වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

7. සංස්ථාවේ සියලු ආදායම් සහ වියදම් පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සංස්ථාවේ පාලක සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය. සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ සියලු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සංගමයට අයවිය යුතුව ඇති සියලු ණය සහ ගෙවිය යුතුව ඇති දායක මුදල් හා ආධාර මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

දේපළ දැරීමට සංස්ථාවට ඇති බලය.

**9.** (1) යම් මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ හෝ බද්දට ගැනීමේ සාධන පත්‍රයක් ප්‍රකාර හෝ යම් තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාරව හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු කරනු ලැබූ යම් චංචල හෝ නිශ්චල දේපළක්, සංස්ථාව විසින් අත්කර ගැනීම සහ දැරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) කලින් කල, එවැනි යම් දේපළක් උකස් කිරීමට, විකිණීමට, ප්‍රදානය කිරීමට, හිමිකර දීමට, රික්ථවරණය කිරීමට, පවරා දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීමට ද සමිතියේ පරමාර්ථ ඉටු කිරීම සඳහා සංස්ථාවේ පාලක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය හෝ සුදුසු ආකාරයකට සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමට ද සංස්ථාවට බලය තිබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**10.** පහත සඳහන් දේ සංස්ථාව විසින් කිරීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය ඉඩම් සහ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම හා වෙනත් ආකාරවලින් ලබා ගැනීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සංස්ථාවේ පාලක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකට ආයෝජනය කිරීම සහ එවැනි යම් ආයෝජන කලින් කල වෙනස් කිරීම සහ මාරු කිරීම :

(ඇ) සංස්ථාවේ පාලක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට, යම් ඇප මත මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම හෝ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන් ඇපවීම හෝ එම ණය හෝ බැඳීම් ගෙවා නිදහස් කිරීම :

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා සියලු අන්දමේ දායක මුදල්, ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග ඉල්ලා සිටීම හා ලබා ගැනීම සහ භාර ගැනීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථවලට අදාළ විෂයයන් පිළිබඳව පොත්පත්, සඟරා, පත්‍රිකා, අත් පිටපත් සහ ලේඛන සහිත පුස්තකාලයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම:

(ඊ) නිශ්චිත කාර්ය සඳහා විවිධ අරමුදල් පිහිටුවා පවත්වා ගෙන යාම ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් පහකිරීම හෝ ඔවුන්ගේ සේවය නතර කිරීම සහ සංස්ථාවේ පාලක සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන වැටුප්, දීමනා, ප්‍රසාද මුදල් හා පාරිතෝෂික ඔවුන්ට ගෙවීම ;

(ඌ) සංස්ථාවේ වර්තමාන සහ කලින් සිටි නිලධරයන්ට හා සේවකයන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට පාරිතෝෂික, විශ්‍රාම වැටුප්, දීමනා සහ වෙනත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම සඳහා යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හෝ එවැන්නකට දායක මුදල් ගෙවීම:

(එ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ යම් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල සමග හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමග යම් ගිවිසුමකට එළඹීම : සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි හා සාර්ථක ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ කිරීම.

**11.** සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර, කවර හෝ සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු ය. තවද ඒ සාමාජිකයන් දෙදෙනා ඒ අවස්ථාවේ දී පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**12.** සංස්ථාවේ සාමාජිකයකුගෙන් සාමාජික මුදල් වශයෙන් සංස්ථාවට අයවිය යුතු මුදල ඉක්මවන කිසිම සම්මාදම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් කාර්යය සඳහා හෝ ගෙවීමට කිසිදු සාමාජිකයකු බැඳී නැත්තේ ය. සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**13.** සංස්ථාව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව එහි සියලුම ණය සහ බැරකම් ගෙවා බේරුම් කිරීමෙන් පසු, කවර වූ හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දෙපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය. ඒ ආයතනය හෝ ආයතන කවරේ ද යන වග, සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින්, තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**15.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.